## දෙහිවල සත්ත්වෝද්‍යානය වෙනුවෙන් අර්ථවත් යමක් කරමු

මෙම ඉල්ලීම පහත සඳහන් මහත්වරුන්ගෙනි.

- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු ජනාධිපති, මෛත්‍රීපාල සිරිසේන මහතා
- ගරු අග්‍රාමාත්‍ය, රනිල් වික්‍රමසිංහ මහතා
- සංචාරක අමාත්‍ය ගරු ජෝන් සෙනෙවිරත්න මහතා
- තිරසාර සංවර්ධනය සහ වනජීවී අමාත්‍ය ගරු ගාමිණී පෙරේරා මහතා
- නාගරික සැලසුම් සහ ජල සම්පාදන අමාත්‍ය ගරු රවුෆ් හකීම් මහතා
- වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, එච්.ඩී.රත්නායක මහතා

අපි විසින් යෝජනා කරන්නේ අවුරුදු 80 ක් පමණ පැරණි සතුන්ට ඉතාමත් කෲර සහ අමානුෂික ලෙස සලකන ඔවුන් ඉතාමත් අපිරිසිදු පරිසරයක ඈද දමා තිබෙන දුර්වල ආයතනයක් වන ශ්‍රී ලංකාවේ ජාතික සත්ත්වෝද්‍යානය (මින් පසුව දෙහිවල සත්ත්වෝද්‍යානය ලෙස සඳහන් කරමු) මහජනතාවට පහත පරිදි ප්‍රයෝජනයට ගත හැකි ස්ථානයක් ලෙස පරිවර්තනය කරන ලෙසයි.

- මෙම සතුන්ගේ මූලික අවශ්‍යතාවයන් සපුරා ගත හැකි සුදුසු දේශීය සහ ජාත්‍යන්තර අභය භූමින් වෙත ඔවුන් මුදා හැරීමට පහසුකම් සලසා සත්ත්වෝද්‍යානය වසා දැමීම.

- එසේ කිරීමෙන් පසුව දෙහිවල සත්ත්වෝද්‍යානයේ ඉතාමත් වටිනා ඉඩම් මෙරට නේවාසිකයින්ට සහ අමුත්තන්ට වඩාත් සෙත සැලසෙන ලෙස යෙදවීම.



ප්‍රායෝගිකව සිදුකළ හැකි, වාණිජ ශක්‍යතාවයක් සහිත, තිරසාරාත්මක මෙන්ම මානුෂීය මෙම යෝජනාවට අදාළ තොරතුරු පහත දැක්වේ.

1ග දෙහිවල සත්ත්වෝද්‍යානය වසා දැමීම-

- හේතුව- දෙහිවල සත්ත්වෝද්‍යානය යල් පැන ගොස් තිබෙන අතර එය ප්‍රමාණවත් නොවන්නා සේම එහි පරිසරයේ තත්ත්වය ඉතාමත් අපිරිසිදු මෙන්ම අමානුෂික වේ. දෙහිවල සත්ත්වෝද්‍යානයේ සතුන් වෙනුවෙන් මේ වනවිට ඇති කුඩු බොහෝමයක ඉඩ පහසුකම් ඔවුන්ට ප්‍රමාණවත් නොවන අතර ඒවායේ ප්‍රමාණවත් පිරිසිදු ජල පහසුකම් හෝ සූර්යා ලෝකය (ජීවිතය සඳහා මූලික අවශ්‍යතා) නොමැත.

- හේතුව- දෙහිවල සත්ත්වෝද්‍යානයේ සතුන් රෝගාතුර වීම, මන්දපෝෂණයට ලක්වීම, තුවාල ලැබීම, ආතතියට ලක්වීම සහ මරණයට පත්වීම පිළිබඳව මාධ්‍ය වාර්තා මගින් වරින් වර අනාවරණය කර තිබේ. මෙම සත්ත්වෝද්‍යානය අවම ජාත්‍යන්තර මට්ටමෙන් හෝ පවත්වාගෙන යාම සඳහා අති විශාල මුදල් ප්‍රමාණයක් වියදම් කළ යුතු අතර එවැනි මුදලක් යෙදීමෙන් පසුව එය නඩත්තු කිරීම සඳහාද විශාල මුදලක් වැයවේ. මෙම සත්ත්වෝද්‍යානය ප්‍රාථමික මට්ටමින් හෝ නවීකරණ කිරීමේදී සතුන් වෙනුවෙන් ස්වභාවික තත්ත්වය ඇතිවන පරිදි විශාල සහ අහසට විවෘත වන කූඩු සකස් කිරීම, පැය 24 පුරා පශු වෛද්‍ය පහසුකම් ස්ථාපිත කිරීම, ඉතාමත් පුහුණු කාර්ය මණ්ඩලයක් යොදාගැනීම, ලබාදෙන ආහාර ප්‍රමාණය සහ ගුණාත්මක තත්ත්වය වැඩිකිරීම, සතුන්ට නිරන්තර ව්‍යායාම සඳහා අවස්ථාව ලබාදීම (මනසට සහ ශරීරයට) සිදුකළ යුතුය. 1936 දී ගොඩනගන ලද දෙහිවල සත්ත්වෝද්‍යානය මෙම ජාත්‍යන්තර තත්ත්වයට සරිලන ලෙස සම්පූර්ණ නවීකරණයක් සිදුකිරීමට බදුගෙවන්නන්ගේ බිලියන ගණනක මුදල් වැය කිරීමට සිදුවනු ඇත.

- හේතුව- දෙහිවල සත්ත්වෝද්‍යානයේ සිටින සතුන් විඳින දුක පිළිබඳව යොමුවී තිබෙන දේශීය මෙන්ම ජාත්‍යන්තර අවධානය රජය සහ මෙරට ජනතාව අපහසුතාවයට පත්කිරීමට හේතුවනු ඇත. මහත්මා ගාන්ධිතුමා වරක් මෙසේ ප්‍රකාශ කර තිබේ. 'ජාතියක උසස් බව ඔවුන් සතුන්ට සලකන ආකාරයෙන් අවබෝධ කරගත හැකිය.' එම ප්‍රකාශය දෙහිවල සත්ත්වෝද්‍යානයේ වර්තමාන තත්ත්වය සමග ගැලපීමේදී මෙම සත්ත්වෝද්‍යානයෙන් මෙරට ජනතාවට සිදුවන්නේ බලවත් අසාධාරණයක් මෙන්ම අවමානයකි.

2ග මෙම සතුන් අභය භූමි වෙත මුදා හරින්න (අනිකුත් සත්ත්වෝද්‍යාන වෙත නොවේ)-

- ප්‍රතිඵලය- සතුන් අභය භූමි වෙත මුදා හැරීම මගින් දේශීය සහ අන්තර් ජාතික ප්‍රජාවගෙන් ධනාත්මක මෙන්ම වඩාත් යහපත් ප්‍රසිද්ධියක් ලැබෙනු ඇත. දේශීය අභය භූමි වෙත මුදාහැරිය හැකි සතුන් මෙම පහසුකම් තුළට අඩු පිරිවැයකින් මුදා හැරිය හැකි (උදාහරණයක් ලෙස ආසියානු අලින් වාගොල්ල අභය භූමියට මුදා හැරිය හැකිය: https://www.change.org/p/minister-of-tourism-hon-john-amaratunge-sri-lanka-stop-this-cruelty-in-the-dehiwela-zoo-now) අතර ඉතිරි සතුන් මුදා හැරීම සඳහා ජාත්‍යන්තර අභය භූමි, සත්ත්ව ශුභ සාධන උපදේශකයින් සහ උනන්දුවක් දක්වන පුරවැසියන්ගෙන් සහයෝගය ලබාගත හැකිය. ආධාර මගින් සත්ත්වෝද්‍යානවල සතුන් පුනරුත්ථාපනය කිරීමට සහ සත්ත්ව ශුභ සාධනය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමට සත්ත්ව ප්‍රතිකාර රෝහල් සහ අධ්‍යාපන මධ්‍යස්ථාන අභය භූමි ආසන්නයේ පිහිටුවිය හැකිය. සතුන් සත්ත්වෝද්‍යානවල සිට අභය භූමි වෙත මුදා හැරීමේ ක්‍රියාවලිය සියළු සත්ත්වෝද්‍යානයන් වසා දැමූ කොස්ටරිකා රජයේ ක්‍රියා මාර්ගයන් අධ්‍යනය කිරීම මගින් ඉතාමත් පහසුවෙන් සිදුකළ හැකිය.

- ප්‍රතිඵලය- ශ්‍රී ලංකාවේ 'කරුණාවන්ත පාලන ක්‍රමය' මෙයින් විදහා දැක්වේ. නොසැලකිලිමත් අධිකාරීන්ගේ ග්‍රහණයේ මේ වනවිට දෙහිවල සත්ත්වෝද්‍යානයේ සිටින සතුන් අනේක විධ හිංසාවන්ට පත්වී සිටී. මේ නිසා, 'කරුණාවන්ත පාලන ක්‍රමය' ප්‍රදර්ශනය කිරීමට මේ වනවිට කාලය පැමිණ තිබේ. ඉතාමත් අමානුෂික තත්ත්වයකට පත්ව තිබෙන තමන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් හඬක් නැගීමට නොහැකි මෙම අහිංසක සතුන් වෙනුවෙන් රජය දක්වන කාරුණික භාවය විදහා දැක්වීමේ මහඟු අවස්ථාවක් මේ සමග උදාවී ඇත.

3ග රට වෙනුවෙන් වඩාත් අර්ථවත් යමක් කරන්න-

- යෝජනාව- කොළඹ සත්ත්වෝද්‍යානය පිහිටි අක්කර 11 කින් සමන්විත වටිනා ඉඩම බුද්ධිමත් ලෙස භාවිතා කරන මෙන් ඉල්ලා සිටිමු. පිහිටි නගරයක් සංවර්ධනය කිරීම වෙනුවෙන් මෙතරම් නාගරික ඉඩම් ප්‍රමාණයක් එක්වර ගැනීමේ අවස්ථාව ලැබෙන්නේ ඉතාමත් කලාතුරකිනි. මෙම භූමියේ පිහිටි ඉතාමත්

වටිනා ගස්වැල් ආරක්ෂා කිරීම සඳහා සත්‍ය වශයෙන්ම අර්ථවත් යමක් කිරීමේ අවස්ථාව මෙරට රජයට මින් උදාවේ. මේ අනුව, නිදහසේ සැරිසැරිය හැකි සතුන්ට (මොණරුන්, හංසයින් සහ තාරාවන් වැනි කුරුළු විශේෂ) වාසය කිරීමට ඉඩ සලසමින් මෙම භූමියේ අති විශිෂ්ට මහජන උද්‍යානයක් නිර්මාණය කිරීමේ අවස්ථාව රජයට තිබේ. මෙයට සම්බන්ධව රජයට ආදායම් ලැබිය (ප්‍රවේශ ගාස්තු මගින්) හැකි උද්භිද උද්‍යානයක්, සමනල උද්‍යානයක් සහ/හෝ ජල උද්‍යානයක් වැනි තේමා උද්‍යානයන් ඇතිකළ හැකි අතර එවැන්නක් මෙරට වැසියන් මෙන්ම විදේශකයින් පිනවන ස්ථානයක් වන්නාසේම රජයේ වටිනා වත්කමක් වනු ඇත. මෙම ප්‍රධාන උද්‍යානයේ සහ අනුබද්ධ උද්‍යාන අවට ප්‍රදේශ දේශීය ආහාර පාන වෙළෙඳුන්ට බඳු දිය හැකි අතර මින් සුළු ව්‍යාපාරිකයින්ට මෙන්ම රජයටද මූල්‍ය වාසියක් සිදුවේ. මෙම ප්‍රතිඵල උපායමාර්ගික, වගකීම් සහගත සහ සංවේදී සැලසුම්කරණයේ ඒකාබද්ධතාවයෙන් ඉටුකර ගත හැකිය.

04. පහසුකම් සැලසීමේ පියවරක් ලෙස, වන සතුන් දඩයම් කිරීම තහනම් කිරීමටත් කැලයෙන් බේරාගන්නා සතුන් සත්ත්වෝද්‍යාන වෙත යැවීම අත්හිටුවීමටත් පියවර ගැනීම-

- ඉක්මන් ක්‍රියා මාර්ගය සඳහා- කැලයෙන් බේරාගන්නා හෝ අල්ලා ගන්නා වන සතුන් ඕනෑම දේශීය හෝ ජාත්‍යන්තර සත්ත්වෝද්‍යානයක් වෙත භාරදීමේ අතිශයින්ම සදාචාර විරෝධී ක්‍රියාව තහනම් කිරීම. පසුගියදා දෙහිවල, පින්නවල සත්ත්වෝද්‍යාන වලට සහ හම්බන්තොට සෆාරි උද්‍යානයට භාරදුන් අනාථභාවයට පත්වූ වන සතුන් (ජාතික සත්ත්වෝද්‍යාන විෂය පථයට ඇතුළත් සියළු අංශ) උඩවලවේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට භාරදී ඔවුන් උඩවලවේ ජාතික වනෝද්‍යානයට මුදා හැරීම ඇතුළත් වේ. මේ පිළිබඳව රජයට විවිධ අවස්ථා වලදී අවධාරණය කළ නමුත් එය තවමත් ඉටුවී නොමැත. :

  https://www.change.org/p/department-of-wild-life-sri-lanka-mr-anura-de-silva-zoo-director-dehiwela-do-not-steal-four-baby-wildlife-cubs-from-uda-walawe-and-giritale-and-subject-them-to-imprisonment-for-life

  https://www.change.org/p/president-of-sri-lanka-he-maithripala-sirisena-minister-of-sustainable-development-wildlife-hon-gamini-jayawickrama-perera-director-general-department-of-wildlife-conservation-mr-h-d-ratnayake-free-the-wild-born-ritigala-elephant-calves-at-pinnavala-?tk=rjvQhe74fWCkvOlXs-5xhamqgw_x4v-T37Bxn43FSS8&utm_medium=email&utm_source=signature_receipt&utm_campaign=new_signature

  මෙම ප්‍රශ්නයට අදාළ ලිපිය සහ මාධ්‍ය නිවේදනය:

  https://www.otarafoundation.com/wp-content/uploads/2015/09/Scan10003.pdf

  https://www.otarafoundation.com/wp-content/uploads/2015/09/Appeal-to-President_Otara-Foundation_English-Translation.pdf

දෙහිවල සත්ත්වෝද්‍යානය යටත් විජිත යුගයේදී ආරම්භ කෙරුණු අතර නිදහසින් පසුව මෙරට පත්වූ රජයන් මෙය නඩත්තු කරනු ලැබුවේ නිසි අවබෝධයකින් තොරව වීම කැපී පෙනේ. ශ්‍රී ලංකාවේ පෞරාණික ඉතිහාසය තුළ මෙවැනි ආයතන තිබූ බවට උදාහරණ නොමැති අතර මෙවැනි සත්ත්වෝද්‍යාන ශ්‍රී ලංකාවේ සංස්කෘතියට නොගැලපේ. මේ අනුව, මෙම කෲර සහ යල්පැන ගොස් තිබෙන ආයතනයට එරෙහිව අර්ථවත් ක්‍රියා මාර්ගයක් ගැනීමට කාලය පැමිණ තිබෙන අතර සත්ත්වෝද්‍යාන තුළ සිරගත කර තිබෙන අහිංසක සතුන් වෙනුවෙන් හඬ නැගිය යුතු කාලය පැමිණ තිබේ.